# වී ගොවිතැන් තරඟය
# මහ 1967-68

## ව්‍යවස්ථා

1. **තරඟයට ඇති ඉඩකඩ.**—සෑම ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයක් පාසාම මුදලින් පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි ජයග්‍රාහකයන්ට රු. 750, රු. 300, රු. 100 යනුවෙන් ත්‍යාග තුනක් පිරිනැමේ. ත්‍යාගයන් ලබා ගැනීමට බැරි වූ ගොවි මහතුන්ට ඔවුන්ගේ විශිෂ්ඨ භාවයන් උදෙසා සම්මාන සහතික පත් පිරිනමනු ලැබේ. මීට අමතර ව දිස්ත්‍රික්කයකින් තෝරා ගන්නා ලද හොඳම ගොවි මහතාට රන් පදක්කමක් බැගින් පිරිනමන අතර, රු. 1,500ක් සැනසිලි ත්‍යාග වශයෙන් පිරිනමනු ඇත. සැනසිලි ත්‍යාග ප්‍රමාණය දිසාපතිතුමා නියම කරනු ඇත.

2. **තරඟකරුවන්ගේ සුදුසුකම්.**—මෙම තරඟය වී ගොවිතැන් කරන කුඹුරු අයිති ගොවි මහතුන්ට හා අඳකරු ගොවි මහතුන්ට විවෘතව ඇත. කුඹුරේ සියළුම වැඩ කටයුතු වල සම්පූර්ණ පාලනයත්, මෙම අය තුළ තිබිය යුතුය. එනම් වැපිරීම, ගොවිතැන් බලා ගැනීම හා අස්වැන්න නෙලා ගැනීම ආදී කරුණු ඇතුළත් වේ. පාඨශාලාවන්ට මෙම තරඟයට ඇතුළත්වීමට නොහැකිය. ආදායම් පාලක කොට්ඨාශයක 1966-67 මහ කන්නයේ දී පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි ස්ථානයන් අත්කර ගත් ගොවි මහතුන්ට 1967-68 මහ කන්නයේ පවත්වන තරඟයේදී මුදල් ත්‍යාගයන් නැවත වරක් දිනා ගැනීමට ඉඩක් නැත. නමුත් දිස්ත්‍රික්කයකට ප්‍රදානය කරන රන් පදක්කම දිනාගැනීම සඳහා මෙම තරඟයට තරඟකරුවකු ලෙස ගොවි මහතුන්ට ඇතුලත් වීමට කිසිම අවහිරයක් නොමැත.

3. **කුඹුරේ ප්‍රමාණය.**—තරඟකරුවන්ගේ කුඹුරු කැබලිවල ප්‍රමාණය අක්කර $\frac{1}{2}$ (භාගයකට) අඩු නොවිය යුතුය.

4. **වී වර්ගයන්.**—තරඟකරුවන්ගේ ප්‍රදේශයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඇති නුමුහුන් වී වර්ගයන්ගෙන් එකක් පාවිච්චි කල යුතුමය.—එච්. 4, එච් 7, එච් 8, එච් 105, එච් 501, පොඩි වී ඒ 8, පී. ටී. බී. 16. මුරුංගකායන් 302 හා පච්චපෙරුමාල්.

5. **රසායනික පෝර.**—තරඟකරුවන්ගේ ප්‍රදේශයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඇති රසායනික පෝර මිශ්‍රණයන් හා නිර්දේශ කර ඇති නියමිත ප්‍රමාණයන් හෝ ඊට වැඩි ප්‍රමාණයන් ප්‍රයෝජනයට ගත යුතුය.

රසායනික පෝර ලබාගත් බවට නියමිත කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

6. **වල් පැළෑටි මර්ධනය.**—තරඟකරුවන් තමන්ගේ කුඹුරු වල් පැළෑටි වලින් තොරව තබාගත යුතුය. මර්ධන කටයුතු, වල් නෙළී

මෙන් හෝ නෙලුම් කරයක් මාර්ගයෙන් හෝ සුදුසු වල් නාශක බෙහෙත් ඉසී මෙන් කර ගත හැකිය. වල් නාශක බෙහෙත් පාවිච්චි කරන්නේ නම් ලබා ගත් බව ඔප්පු කිරීමට කුවිතාන්සි තිබිය යුතුය.

**7. පැළෑටි සංරක්ෂණය.**—ලෙඩ රෝගවලින් හා කෘමි නාශකයන් ගෙන් ගොයම ආරක්ෂා කරගත යුතුය. මෙය සඳහා ද හොඳ බෙහෙත් වර්ග ලබාගත් බවට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

**8. වාර්තා සටහන්.**—තරඟකරුවන් තමන් ගේ කුඹුරේ කරන ලද සියළුම වැඩ ගැන සම්පූර්ණ වාර්තාවක් දින සහිතව තබාගත යුතුය. මෙය සඳහා වාර්තා සටහන් කිරීම සඳහා විශේෂ පත්‍රයක් තරඟකරුවන්ට එම අයගේ නම් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් වූ විට ප්‍රදානය කෙරේ. මෙම වාර්තා සටහන විනිශ්චය කරන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුමය.

## විනිශ්චය

දිස්ත්‍රික්ක භාර දිසාපති තුමා විසින් පත් කරන ලද විනිශ්චය මණ්ඩලයකින් විනිශ්ච යන් කරනු ලැබේ.

ඉහත සඳහන් ව්‍යවස්ථාවන්ට පටහැනිව තරඟකරුවන් ඉදිරිපත් වී සිටිද යන්න සොයා බැලීමෙන් තරඟකරුවන්ගේ මූලික ඉවත් කිරීම් කරනු ලැබේ.

අවසාන තරඟකරුවන් ලෙසට තෝරා ගනු ලබන්නේ තරඟකරුවෙක් ලෙසට තිබිය යුතු සියළුම ව්‍යවස්ථාවන් සම්පූර්ණ කළ අය පමණි.

අවසාන තරඟකරුවන් විනිශ්චය කරනු ලබන්නේ එම අය ලබා ඇති අස්වනු අනුවය.

තරඟකරුවන් ඉදිරිපිටදී එම අයගේ කුඹුරු වලින් සාමාන්‍ය ප්‍රමාණයේ සාම්පල් කොටු කපා අස්වැන්න ගණන් ගැනීමෙන් විසඳනු ඇත.

ත්‍යාගයන් හිමිකර ගැනීමට (මුදලින්) තරඟකරුවන්ගේ අස්වනු ප්‍රමාණයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එම දිස්ත්‍රික්ක යන්ට අනුමත කර තිබෙන සාමාන්‍ය අස්වනු ප්‍රමාණයන්ට වැඩියෙන් ලබා තිබිය යුතුය.

අවසාන තරඟකරුවන් ලෙස තෝරා ගත් විට එම අයට එම ප්‍රදේශයන්ගේ සාමාන්‍ය අස්වනු දන්වනු ඇත.

## ලියාපදිංචිය

ඔබ මෙම තරඟයට ඉදිරිපත් වීමට සුදුසු නම් ඉහත සඳහන් ව්‍යවස්ථා මාලාවන්ට එකඟ ව ක්‍රියා කරන්නට කැමති නම්, විනිශ්චය මණ්ඩලයේ තීරණයන් අවසාන තීරණයන් සේ භාර ගැනීමට කැමති නම් කරුණාකර ඔබ පළාතේ සේවය කරන ආහාර නිෂ්පාදන ඔවර්සියර් මහතා ගෙන් ලියාපදිංචිය ලබා ගන්න.

ඔවර්සියර් මහතා ළඟ හෝ කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන් හෝ ලියාපදිංචි වීමේ විශේෂ ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රයක් ලබාගත හැක.

ලියාපදිංචි වීමේ ආකෘති පත්‍රයත් නියම අන්දමට පුරවා වාර්තා සටහන් පත්‍රයක් එමගින් ලබා නොමැති නම් ඔබ තරඟකරු වෙක් ලෙස භාර ගැනීමට නුසුදුසුවන් බව සලකන්න.

**මෙම තරඟයේ සිරි බලන්න-ලියා පදිංචිය ලබන්න**
**ආසිරි මල් වැසි වගින්න-දෙවියන්ගේ පිහිට මෙන්න**